සැ. යු. - 2021.08.27 වැනි දින අංක 2243 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,244 - 2021 සැප්තැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1852 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1853 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1857 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1859 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 සැප්තැම්බර් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2021***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2021.09.17 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගන්නා ස්ථානය* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| දකුණු පළාත | මාතර | කොටපොල | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල | කොටපොල අවට නගර | 2021.11.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩපහසුකම් ද තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර හෝ ඉඩ පහසුකම් ද තිබිය යුතු ය. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2500 පමණ හෝ ඊට වැඩි විය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2021.09.17 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

ඩබ්. ටී. එම්. එස්. බී. තෙන්නකෝන්,
සර්වේයර් ජනරාල්.

2021 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2021*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2021**

*ගොඩනැගිලි අයිතිකරුගේ -*

1. සම්පූර්ණ නම : _____________.
2. ලිපිනය : _____________.
3. දුරකථන අංකය : _____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : _____________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : _____________.
2. මාසික කුලී මුදල : _____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : _____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : _____________.
5. භූමියේ විශාලත්වය : _____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: _____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : _____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : _____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : _____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : _____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් ම විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

_____________.
අයදුම්කරුගේ අත්සන.

09-68

---

# බඩු බාහිරාදිය විකිණීම්

## දැන්වීමයි

### දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ

වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී රාජසන්තක කරන ලද, හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2021.09.25 වැනි දින පෙ. ව. 10.00 ට පමණ මෙම අධිකරණ භූමියේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(වෙන්දේසියට අදාළ විස්තර 2021.05.07 සිකුරාද දින පළ වූ අංක 2,227 රජයේ ගැසට් පත්‍රය බලන්න).

පමෝද ජයසේකර,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැලිමඩ.

2021 අගෝස්තු මස 09 වැනි දින,
වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

09-15

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - සියඹලාණ්ඩුව

### ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරනු ලැබූ හෝ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2021.09.25 වැනි සෙනසුරාද පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීම නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලෙහි ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියැදුරු බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

ඩී. එම්. ආර්. ආර්. බණ්ඩාර,
මහෙස්ත්‍රාත්,
සියඹලාණ්ඩුව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩය* |
|---|---|---|
| 01. | BR 56/17 | UP BCN 3620 යතුරු පැදිය |
| 02. | 12013 | UP BCB 4253 යතුරු පැදිය |
| 03. | 73646 | EP BCD 9867 යතුරු පැදිය |
| 04. | 11747 | ගෑස් සහිත සිලින්ඩර් 01 |
| 05. | 12180 | උදලු 01 |
| 06. | 10738 | උදලු 01 |
| 07. | 12337 | උදලු 01 |
| 08. | 11951 | උදලු 01 |
| 09. | 12975 | උදලු 01 |
| 10. | 12426 | උදලු 01 |
| 11. | 13361 | උදලු 01 |
| 12. | 12001 | උදලු 02 |
| 13. | 7307 | කැති 01 |
| 14. | 13582 | කැති 01 |
| 15. | 13362 | කැති 01 |
| 16. | 11909 | කැති 01 |
| 17. | 13116 | කැති 01 |
| 18. | 12148 | කැති 01 |
| 19. | 13115 | කැති 01 |
| 20. | 11329 | කැති 01 |
| 21. | 10200 | ඉල්ලන් කුරු 01 |
| 22. | 9304 | ඉල්ලන් කුරු 01 |
| 23. | 11476 | ඉල්ලන් කුරු 01 |
| 24. | 12218 | ඉල්ලන් කුරු 01 |
| 25. | 11495 | සවල් 01 |
| 26. | 11585 | සවල් 01 |
| 27. | 11629 | සවල් 01 |
| 28. | 11295 | සවල් 01 |
| 29. | 12188 | සවල් 01 |
| 30. | 4218 | සවල් 01 |
| 31. | 10448 | සවල් 01 |
| 32. | 11288 | සවල් 01 |
| 33. | 11304 | සවල් 01 |
| 34. | 11709 | සවල් 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 35. | 12098 | සවල් 01 |
| 36. | 11875 | සවල් 01 |
| 37. | 12096 | සවල් 01 |
| 38. | 11571 | සවල් 02 |
| 39. | 11255 | සවල් 01 |
| 40. | 11425 | සවල් 02 |
| 41. | 12701 | සවල් 01 |
| 42. | 10502 | සවල් 01 |
| 43. | 10503 | සවල් 01 |
| 44. | 10444 | සවල් 01 |
| 45. | AR 212/20 | සවල් 02 |
| 46. | 12286 | සවල් 01 |
| 47. | 11875 | සවල් 01 |
| 48. | 12170 | සවල් 01 |
| 49. | 12113 | සවල් 01 |
| 50. | 11827 | සවල් 01 |
| 51. | 12155 | සවල් 01 |
| 52. | 12137 | සවල් 01 |
| 53. | 11333 | සවල් 02 |
| 54. | 11415 | සවල් 01 |
| 55. | 11758 | සවල් 01 |
| 56. | 10515 | සවල් 01 |
| 57. | 10526 | සවල් 01 |
| 58. | 12171 | සවල් 01 |
| 59. | 12583 | සවල් 01 |
| 60. | 12953 | සවල් 01 |
| 61. | 12907 | සවල් 01 |
| 62. | 12968 | සවල් 01 |
| 63. | 11852 | වේවැල් කුඩ 01 |
| 64. | 11899 | වේවැල් කුඩ 01 |
| 65. | 9704 | වේවැල් කුඩ 01 |
| 66. | 67552 | වේවැල් කුඩ 01 |
| 67. | 383 | වේවැල් කුඩ 01 |
| 68. | 10777 | වේවැල් කුඩ 01 |
| 69. | 377 | වේවැල් කුඩ 01 |
| 70. | 11152 | ප්‍රේෂර් කුකර් 01 |
| 71. | 11476 | ප්ලාස්ටික් තාච්චු 02 |
| 72. | 11916 | කුඩා බේසම් 01 |
| 73. | 12744 | ප්ලාස්ටික් බකට් 01 |
| 74. | 11763 | චිත්තා පැදුරු 01 |
| 75. | 11557 | චිත්තා පැදුරු 03 |
| 76. | 2385 | ටෙන්ඩ් රෙදි 01 |
| 77. | 10807 | ප්ලාස්ටික් බකට් 01 |
| 78. | 11455 | ප්ලාස්ටික් බකට් 06 |
| 79. | 13412 | හිස් බූලි 01 |
| 80. | 13454 | හිස් බූලි 01 |
| 81. | AR 112/21 | හිස් බූලි 01 |
| 82. | AR 111/21 | හිස් බූලි 01 |
| 83. | 13241 | හිස් බූලි 01 |
| 84. | 12018 | හිස් බූලි 01 |
| 85. | 12304 | හිස් බූලි 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 86. | AR 107/21 | හිස් බූලි 01 |
| 87. | 9127 | හිස් බූලි 01 |
| 88. | 13081 | හිස් බූලි 01 |
| 89. | 11941 | හිස් බූලි 01 |
| 90. | 12529 | හිස් බූලි 01 |
| 91. | AR 331/20 | හිස් බූලි 01 |
| 92. | AR 01/21 | හිස් බූලි 01 |
| 93. | AR 330/20 | හිස් බූලි 01 |
| 94. | 8829 | හිස් බූලි 02 |
| 95. | AR 49/21 | හිස් බූලි 01 |
| 96. | 11176 | හිස් බූලි 01 |
| 97. | 12871 | හිස් බූලි 01 |
| 98. | AR 342/20 | හිස් බූලි 01 |
| 99. | 13011 | හිස් බූලි 01 |
| 100. | 11051 | හිස් බූලි 01 |
| 101. | 12310 | හිස් බූලි 01 |
| 102. | 13173 | හිස් බූලි 01 |
| 103. | 12400 | හිස් බූලි 01 |
| 104. | 10992 | හිස් බූලි 01 |
| 105. | 12776 | හිස් බූලි 01 |
| 106. | 12719 | හිස් බූලි 01 |
| 107. | 12022 | හිස් බූලි 01 |
| 108. | 11811 | හිස් බූලි 01 |
| 109. | 12685 | හිස් බූලි 01 |
| 110. | 10262 | හිස් බූලි 01 |
| 111. | 12625 | හිස් කෑන් 01 |
| 112. | 11307 | හිස් කෑන් 01 |
| 113. | 11158 | හිස් කෑන් 01 |
| 114. | 12221 | හිස් කෑන් 01 |
| 115. | 12077 | හිස් කෑන් 01 |
| 116. | 12817 | හිස් කෑන් 01 |
| 117. | 12874 | හිස් කෑන් 01 |
| 118. | 12207 | හිස් කෑන් 01 |
| 119. | 11986 | හිස් කෑන් 01 |
| 120. | 12409 | හිස් කෑන් 01 |
| 121. | 12097 | හිස් කෑන් 01 |
| 122. | 4612 | හිස් කෑන් 01 |
| 123. | 1197 | හිස් කෑන් 01 |
| 124. | 6321 | හිස් කෑන් 01 |
| 125. | 11474 | ප්ලාස්ටික් බැරල් 01 |
| 126. | AR 102/21 | ප්ලාස්ටික් බැරල් 01 |
| 127. | 13580 | ප්ලාස්ටික් බැරල් 01 |
| 128. | 13530 | ප්ලාස්ටික් බැරල් 01 |
| 129. | 13432 | ප්ලාස්ටික් බැරල් 01 |
| 130. | - | විවිධ නඩු අංක යටතේ නඩු කටයුතු අවසන් වූ විවිධ ප්‍රමාණයෙන් යුත් හිස් වීදුරු බෝතල් 434 ක තොගය. |

09-14

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2007.09.24 වැනි දිනැති Altsatten ස්විට්සර්ලන්තය නොතාරිස් lic.iar. Th. Hubatka මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මොරටුව, සොයිසාපුර, සොයිසාපුර තට්ටු නිවාස, අංක 15 - 1/1 හි පදිංචි බාලසුබ්‍රමනියම් තවේන්ද්‍රකුමාර් යන අයට කොළඹ - 06, වැල්ලවත්ත, සාන්ත ලෝරන්ස් පටුමග, අංක 54 -8/3 හි පදිංචි සහ දැනට Im Nonnental - 3, 9450, Altstatten, Switzerland හි පදිංචි බාලසුබ්‍රමනියම විමලේන්ද්‍රකුමාර් සහ විමලේන්ද්‍රකුමාර් මාලිනි වන අප විසින් ලබා දුන් එකී ඇටර්නි බලපත්‍රය 2021.08.16 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මේදින සිට ඇටර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට අප වගකියනු නොලැබේ.

බාලසුබ්‍රමනියම් විමලේන්ද්‍රකුමාර්,
විමලේන්ද්‍රකුමාර් මාලිනි.

2021 අගෝස්තු මස 16 වැනි දින.

09-19

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වෙලන්ගොල්ලවත්ත, කුරුණෑගල පදිංචි බුවනෙකබාහු හිත්තරගෙදර කමලාවතී වන මා විසින් වර්ෂ 2013.06.05 වැනි දින වසන්තා අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් ලියා සහතික කළ අංක 16836 දරන ඇටෝර්නි බලපත්‍රය එම යන්තම්පලාව කලහොගෙදර, හෙට්ටියාවත්ත, අංක 604 දරන ස්ථානයේ පදිංචි බුවනෙකබාහු හිත්තරගෙදර සෝමරත්න යන අයට දෙන ලද සියලුම අයිතිවාසිකම් මෙයින් අවලංගු කර බල රහිත කරන බව මෙයින් දන්වා සිටිමි.

බී. එච්. කමලාවතී.

09-20

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නො. 18/1, නුවර පාර, කුරුණෑගල පදිංචි මොහමඩ් ෆස්ලි මොහමඩ් රිෆයිඩීන් වන මා විසින් නො. 244, පරගහදෙනිය, වෑඋඩ හි පදිංචි මොහමඩ් නජුමුඩීන් මොහමඩ් මෆාස් යන අයට ලබාදී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ෆාතිමා එන් අන්සාර් මහත්මිය විසින් ලියා සහතික කළ අංක 1363 සහ 2009.09.25 දිනැති ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

09-21

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාලබේ, වැව පාර, අංක 287/15/18 හි පදිංචි කලුබෝවිලගේ නයනා දේවිකා ශාමලී වන මා විසින් කලුබෝවිලගේ ප්‍රේමලතා ප්‍රියංගනී ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් පිළියෙල කළ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ගුණවර්ධන සඳුන් සාලිය මහතා විසින් සකස් කළ අංක 769 සහ 2016.11.28 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2021.08.17 සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර මින් මතු එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද සියල්ලන් වෙත මෙයින් දැනුම් දෙමි.

කලුබෝවිලගේ නයනා දේවිකා ශාමලී.

09-22

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් (පීබී 379) සමාගම, 2021 අගෝස්තු 11 වැනි දින ලැයිස්තුගත සමාගමක් බවට පත් කරනු ලැබීම හේතුවෙන්, හි නාමය, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (3) වගන්තිය ප්‍රකාරව, සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි පීඑල්සී ලෙස, 2021 අගෝස්තු 11 වැනි දින සිට බලාත්මක වන පරිදි වෙනස් කොට ඇති බව, එම පනතේ 11 (5) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ප්‍රසාදිකා සේනාධීර,
සමාගමේ ලේකම්.

2021 අගෝස්තු මස 11 වැනි දින දී ය.

09-41

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : කොඩෙක්ස් ඉනෝවේටිව් සොලූෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00241440
සංස්ථා ගතකළ දිනය : 2021 ජූලි 04 වැනි දින
ලියාපදිංචි ලිපිනය : වදිරි බංගලා, නෙල්ලියඩි නැගෙනහිර කරවෙඩ්ඩි

ඉහත සමාගම වෙනුවෙන්,

තංගරාජා ධනුෂන්,
සමාගම් ලේකම්.

09-42

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

කුරුවිට ගෝනපිටිය ගඟ පාර ලිපිනයේ පදිංචි වීරක්කොඩි වසන්තා (ජා. හැ. අ. 665552535V) වන මා විසින් පද්මා ගම්ලත් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස්වරිය විසින් 2019.05.22 වැනි දින ලියා සහතික කළ අංක 1466 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ගාල්ල දඩල්ල මහමුදලි මාවත අංක 30/2, යන ලිපිනයේ පදිංචි කොක්මාදූව, මුදලිගේ අමරාවතී (ජා. හැ. අ. 196667902491) වෙත පවරන ලද බලය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

වීරක්කොඩි වසන්තා.

09-51

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වග, පින්නවල, අංක 34/6/ඩී හි පදිංචි ඉහල ගමරාලලාගේ චාමින්ද ප්‍රභාත් ප්‍රියන්ත (ජා. හැ. අ. 740620550 V) වන මා විසින් අයි. ඩී. රංගොඩ ආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 32 සහ වර්ෂ 2012.08.02 වන දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් වග, පින්නවල අංක 34/6/ඩී හි පදිංචි කඩුගොඩගේ සන්ධ්‍යා කුමාරි (ජා. හැ. අ. 787270379 V) හිමි අයට ලබා දී ඇති විශේෂ ඇටෝර්නි බලය 2021.09.07 දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන බවත්, මින් මතු එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී සාමාන්‍ය ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ඉහල ගමරාලලාගේ චාමින්ද ප්‍රභාත් ප්‍රියන්ත.

09-84

---

## සමාගමක් සංස්ථාගත කිරීමේ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2021 අගෝස්තු මස 26 දින සංස්ථාගත කර ඇති බවට මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ස්ට්‍රැටජික් කන්සල්ටිං පාර්ට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක - PV 00244317
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 98/M/32, සීනික් වියු, කහන්තොට පාර, මාලබේ 10115

පී. එම්. ඩී. කෝරළේගේ,
සමාගම් ලේකම්.

09-85

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී ජී ජේ ආර් පුෂ්පකුමාර.
ගිණුම් අංක : 0022 5002 0530.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දස කෝටි විසි අට ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය අසූ හයයි ශත අටක (රු. 102,883,386/08) මුදලද, 2020 සැප්තැම්බර් 02 දින සිට අංක 3286, 3223, 3466 සහ 3468 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි තුන් ලක්ෂ අසූ හය දහසක (රු. 90,386,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් තිස් පන් ලක්ෂ දස දහසක (රු. 3,510,000/-) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.10.19 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.10.14 වැනි දින උපලේඛන 01 හි සඳහන් දේපළ පෙ. ව. 11.00 ට ද, උපලේඛන 02හි සඳහන් දේපළ ප. ව. 12.00 ටද, උපලේඛන 03 හි සඳහන් දේපළ පෙ. ව. 11.30 ට ද අවිස්සාවේල්ල සම්පත් බැංකුව නො. 64, යටියංතොට පාර, අවිස්සාවේල්ල යන ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ සහ සිතාවක අංක. 432 B දරන ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ අවිස්සාවේල්ල පිහිටි ''මිල්ලගහකුඹුර නොහොත් කෝන්ගහකුඹුර'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2010 අප්‍රේල් 25 (2010 අප්‍රේල් 21- 23 උපබෙදුමක් සහ නැවත මිනුමක් වන) දාතම හා අංක 4827 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක. 550A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නැගෙනහිරට : මෙහි ලොට් 2 දකුණට : පාර බස්නාහිරට : පාර සහ අංක 550 A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් තුනයි දශම අටයි හතයි පහක් (අ. 0, රූ. 1, පර්. 33.875 විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 4827 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 243/101 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3286 සහ 3623 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ සහ සීතාවක නගර සභා සීමාවන් තුළ සීතාවක ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ අංක 432/B අවිස්සාවේල්ල රත්නපුර පාර පිහිටි ''හල්ගහකුඹුර සහ මිල්ලගහකුඹුර කෝන්ගහකුඹුර හි කොටසක්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2006 නොවැම්බර් 22 (2019 ජුනි 21 දින මායිම් සත්‍යාපනය කරන ලද) දාතම හා අංක 4002 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඩී ජේ පී රොෂාන් කුමාර යන අය විසින් හිමිකම් කියනු ලබන අංක 5030 දරන පිඹුරේ ලොට් 1 A නැගෙනහිරට : ඇළ කලගහවත්ත නොහොත් මිනෙරල් ස්ප්‍රිං එස්ටේට් දකුණට : අංක. 550A දරණ පිඹුරේ ලොට් 3 බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම හතරයි නමයක් (අ. 0, රූ. 1, පර්. 31.49) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 4002 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 282/57 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3466 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට)

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ උඩුගහ පත්තුවේ සීතාවක නගර සභා සීමාවන් තුළ හංවැල්ල ප්‍රාදේශිය මහ ලේකම් කාර්යාල කොට්ඨාශයේ සහ සිතාවක අංක. 432 B දරන ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ අවිස්සාවේල්ල පිහිටි ''මිල්ලගහකුඹුර නොහොත් කෝන්ගහකුඹුර'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ වෙලගෙදර යන අය විසින් සාදන ලද 2010 අප්‍රේල් 25 (2010 අප්‍රේල් 21- 23 උපබෙදුමක් සහ නැවත මිනුමක් වන) දාතම හා අංක 4827 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 550A දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නැගෙනහිරට : අංක 1449 දරන පිඹුරේ ලොට් A දකුණට : පාර බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නමයයි දශම හතයි අටයි පහක්

(අ. 0, රූ. 1, පර්. 9.785) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියළු දේ සමග අංක 4827 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 280/32 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3468 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09-74/1

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. ආර්. එස්. යාපා සහ පී. එස්. යාපා.
ගිණුම් අංක : 1079 5755 1941.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.07.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි දහසය ලක්ෂ තිස් හතර දහස් අටයි ශත පනස් හතක (රු. 11,634,008.57) මුදල ද, 2019 ජූලි මස 02 වැනි දින සිට අංක 3753 සහ 5235 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි දොළොස් ලක්ෂ අසූ නම දහස් අටසිය විසි දෙකයි ශත අනූ හතක (රු. 11,289,822.97) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.09.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.09.03 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.10.15 වැනි දින පෙ. ව. 11.00 ට සම්පත් බැංකුව සුපිරි ශාඛාව, ගාල්ල නො. 05, වක්වැල්ල පාර, ගාල්ල යන ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, උතුරු ගගබොඩ පත්තුවේ, නාගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ අලුත්තානායම්ගොඩ අංක 214 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි "දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එල්. ඩබ්ලිව්. ගුණසේකර යන අය විසින් සාදන ලද 2007 මැයි මස 26 දාතම හා අංක 231 දරන පිඹුරේ සහ 2018 අප්‍රේල් මස 24 දාතම දරන පිටසන යන දෙකෙහිම නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලේගෙදරවත්ත නොහොත් අලුත්ගෙදරවත්ත, නැගෙනහිරට : ගිංගඟ හංගරමවත්ත නොහොත් ගඟඅද්දරවත්ත, මෙම ඉඩමේ ලොට් 3 සහ අංක 1687B දරන පිඹුරේ ලොට් 18 සහ ලොට් A4 (පාර), දකුණට : ලොට් 3 සහ අංක 1687B දරන පිඹුරේ ලොට් 9 සහ ලොට් A4 (පාර) සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත සහ ලොට් A4 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි පහයි දශම හතයි බිංදුවක් (A:0, R:3, P:25.70) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 231 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 128/42 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් A පහත සඳහන් යාබද ඉඩම්වල නැවත මිනුමක් සහ ඒකාබද්ධයකි :

1. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තානායම්ගොඩ පිහිටි "දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලේගෙදරවත්ත සහ ගිංගඟ, නැගෙනහිරට : ගිංගඟ, දකුණට : ලොට් A4 (පාර) සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ හතරයි දශම හයයි තුනක් (A:0, R:2, P:14.63) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 1687 B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 54/101 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි "දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක

තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1, නැගෙනහිරට : ලොට් 1 සහ ගඟඅද්දරවත්ත, දකුණට : ගඟඅද්දරවත්ත සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම පහයි හතක් (A:0, R:0, P:23.57) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1687B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 24/187 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි "දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිආච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 8 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A4 (පාර), නැගෙනහිරට : ලොට් 18 (පාර), දකුණට : ලොට් 9 සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි නමයයි දශම පහක් (A:0, R:0, P:29.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1687B දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 54/102 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

09 - 74/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

අයි. එම්. ජේ. ඩබ්ලිව්. එල්. ඉලංගසිංහ,
ගිණුම් අංක : 0149 5000 1810.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි අනූ ලක්ෂ අනූ තුන් දහස් හාරසිය අනූ තුනයි ශත දහසයක (රු. 29,093,493.16) මුදලද, 2019 ඔක්තෝබර් මස 15 වැනි දින සිට අංක 128, 391, 1373, උකස් බැඳුම්කර අංක MM/149/SBL/2015/01 සහ MM/149/SBL/2018/01 ද දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි හැත්තෑ පන් ලක්ෂයක (රු. 27,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.29 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021.08.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.09.29 වැනි දින පෙ. ව. 11.00 ට සහ 11.15 ට කැකිරාව, කෙලින් වීදිය, අංක 56 කැකිරාව සම්පත් බැංකු ශාඛා පරිශ්‍රයන් හි දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, දකුණු තලගම කෝරළේ, කුඩාකැකිරාව හි කැකිරාව ප්‍රදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුඩාකැකිරාව දකුණ අංක 629 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුඩාකැකිරාව ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එම්. කේ. තෙන්නකෝන් යන අය විසින් සාදන ලද 2009 මැයි මස 17 දතම හා අංක 2009/136 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩේසිගේ ඉඩම (වගාවට පිවිසුම), නැගෙනහිරට : ඇළ සහ පාර සඳහා වෙන් කිරීම, දකුණට : ඉලංගසිංහගේ ඉඩම, බස්නාහිරට : ජිනදාසගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (A:0, R:1, P:0) හෝ හෙක්ටයාර් 0.1011 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2009/136 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, දකුණු තලගම කෝරළේ, කුඩාකැකිරාව හි කැකිරාව ප්‍රදේශීය සභා සීමාවන් තුළ

සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුඩාකැකිරාව දකුණ අංක 629 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුඩාකැකිරාව ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" (ශ්‍රී ලංකාවේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් ප්‍රදානය කරන ලද 2001 ජුනි මස 06 දතම හා රාජ්‍ය ප්‍රධාන අංක Anu/Keki/ප්‍ර/2839 හි උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම වන) යයි කියනු ලබන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩේසිගේ ඉඩම, නැගෙනහිරට : ඉලංගසිංහගේ ඉඩම, දකුණට : ඇළ සඳහා වෙන් කිරීම, බස්නාහිරට : ජිනදසගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (A:0, R:1, P:0) හෝ හෙක්ටයාර් 0.1011 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2009/136 පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO R 1/4 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 128 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.).

2. උතුරු මැද පළාතේ, අනුරාධුපරය දිස්ත්‍රික්කයේ, කැකිරාව දකුණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පොතනේගම අංක 634 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දැන් ඉලුකේගම යයි කියනු ලබන ඉලුක්ගොඩගම ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එම්. කේ. තෙන්නකෝන් යන අය විසින් සාදන ලද 2014 අගෝස්තු මස 04 දතම හා අංක 2014/345 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 916හි ලොට් 496 සහ 477, නැගෙනහිරට :FVP 916හි ලොට් 477 සහ 494, දකුණට : FVP 916හි ලොට් 494 සහ 501, බස්නාහිරට : නිවාස සිට ප්‍රධාන පාර දක්වා පාර සහ FVP 916හි ලොට් 496 සහ 501 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හතරයි දශම එකක් (රපඑA:0, R 2:, P:4.1) හෝ හෙක්ටයාර් 0.2128 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2014/345 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

(ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ උතුමන් විසින් ප්‍රදනය කරන ලද 2013 දෙසැම්බර් මස 26 දතම හා රාජ්‍ය ප්‍රධාන අංක Anu/H/MADA/PRA/4205 (ගොඩ) හි උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම).

උතුරු මැද පළාතේ, අනුරාධුපරය දිස්ත්‍රික්කයේ, දකුණු කලමේ පත්තුවේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ. පොතනේගම, අංක 634 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඉලුක්වේගම යයි කියනු ලබන ඉලුක්ගොඩගම ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය ලද FVP 916/10 නිරූපිත සීමා නිර්නය කොට බෙද වෙන් කොට ලොට් 495 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 496 ස 477, නැගෙනහිරට: ලොට් 477 සහ 494, දකුණට : ලොට් 494 සහ 501, බස්නාහිරට : ලොට් 501 සහ 496 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි එකයි දෙකයි අටක් (0.2128 Hec.) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක FVP 916 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO R 4/122 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 391 සහ 1373 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.).

3.

1. උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කය තුළ කැකිරාව ඉලුකේගම අංක 01 භාග්‍යා හාල් මෝල පරිශ්‍රයන්හි තබනු ලබන සහ වෙනස් ස්ථානයක හෝ ස්ථානවලට ගෙනගොස් තබනු ලබන ගබඩා කරනු ලබන හෝ ස්ථාපිත කරනු ලබන මෙහි පහතින් මැනවින් විස්තර කොට ඇති සියලුම හා එක් එක් යන්ත්‍රාගාර යන්ත්‍රසූත්‍ර සහ උපකරණ.

| *Machine* | *Model* | *Serial No.* |
|---|---|---|
| Rubber Roller | MLGT-25A | 0167 |
| Rubber Roller | MLGT-25A | 0178 |
| Elevator (04) | | |
| Separator | | MGCZ 100 8 |
| Stoner | | |
| Grader | MMJP 100X4 | |
| Rice Polisher (1) | 750R/M | |
| Rice Polisher (2) | | 7939 |
| Paddy Cleaner | TQLQ 45 | |
| Stock Tank (1) | | |
| Stock Tank (2) | | |

අංක MM/149/SBL/2015/01 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

Make : Denzui
Model : 2AL 3723 - 200QSTL 7434

අංක : MM/149/SBL/2018/01 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09-75-1

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ජී. එම්. විජේසිංහ, ජී. එම්. ඩී. කේ. විජේසිංහ සහ ආර්. ඒ. එල්. රණසිංහ.

ගිණුම් අංක : 0143 5000 2058.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හත් කෝටි හැටපන් ලක්ෂ විසි දහස් හාරසිය දහසයයි ශත හැත්තෑ එකක (රු.76,520,416.71) මුදල ද, 2020 සැප්තැම්බර් 07 වැනි දින සිට අංක 5300, 4490 සහ 4492 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතුව මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි අසූපන් ලක්ෂයක (රු. 68,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළියද දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.22 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2021.08.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.09.30 වැනි දින පෙ. ව. 11.00, සහ 11.30 ට සහ 11.45 ට ආනමඩුව, ගල්ගමුව පාර, අංක 69, ආනමඩුව සම්පත් බැංකු ශාඛා පරිශ්‍රයන් හි දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තම්මැන්නාගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. මරියදාස් යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 18 දතම හා අංක 3284 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රණසිංහ ලතාගේ ඉඩම සහ මංචනායක ගේ ඉඩම, නැගෙනහිරට : පාර (මා සං අ) සහ එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, දකුණට : එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, සේනානායක ගේ ඉඩම සහ විජේසිංහ ගේ ඉඩම, බස්නාහිරට : විජේසිංහ ගේ ඉඩම සහ රණසිංහ ලලිතා ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (A: 2. R : 0, P : 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 3284 දරන එකී පිඹුරට අනුවය.

අංක 3284 පිඹුරේ නිරූපිත ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තම්මැන්නාගම" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තංගවඩිවේලු යන අය විසින් සාදන ලද 2003 මාර්තු මස 11 දාතම හා අංක 2616 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රණසිංහ ආරච්චිගේ ලලිතාගේ ඉඩම සහ මංචනායක ගේ ඉඩම, නැගෙනහිරට : අඩි පාර සහ එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, දකුණට : එස්. එන්. එම්. සේමසිංහ ගේ ඉඩම, සේනානායක ගේ ඉඩම, බස්නාහිරට : විජේසිංහ ගේ ඉඩම සහ රණසිංහ ලලිතා ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (A: 2. R : 0, P : 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2616 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J/Ana 31/09 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව (පළු) ග්‍රාමයේ පිහිටි තෙන්නන්කුරියාව මූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 09 දාතම හා අංක 3241 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලලිතාගේ ඉඩම, නැගෙනහිරට : ලලිතා ගේ ඉඩම සහ පාර, දකුණට : පාර සහ ලලිතා ගේ ඉඩම, බස්නාහිරට : ලලිතාගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් එකයි පර්චස් විසි දෙකයි දශම තුනයි හයක් (A: 2. R : 1, P : 22.36) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 3241 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව LDO/320/50 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 5300 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

3. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කමරවන්නි පළාතේ, පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව

ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව කැලේ, පලුගහහේන, තන්නන්කුරියහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. මරියදාස් යන අය විසින් සාදන ලද 2017 මාර්තු මස 03 දතම හා අංක 2879 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. එම්. විජේසිංහ ගේ ඉඩම, නැගෙනහිරට : ආඬිගම සිට ගල්ගමුව දක්වා පාර (මා සං අ), දකුණට : ඩී. එම්. බේබි නෝනා ගේ ඉඩම, බස්නාහිරට : ජී. එම්. විජේසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි නමයක් (A: 0. R : 0, P : 12.69) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2879 දරන එකී පිඹුරට අනුවය.

අංක 2879 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1, බලයලත් මානක තැන වී. විග්නේෂ්වරන් විසින් සාදන ලද 2009 ජූලි මස 18 දාතම හා අංක 4327 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි නැවත මිනුමක් වන අතර තවත් අයුරකින් පහත සඳහන් ඉඩමේ නැවත මිනුමක් ද වේ.

එකී තෙන්නන්කුරියාව ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව කැලේ, පලුගහහේන, තන්නන්කුරියහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තංගවඩිවේලු යන අය විසින් සාදන ලද 1998 නොවැම්බර් මස 17 දාතම හා අංක 510 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. එම්. විජේසිංහ ගේ ඉඩම, නැගෙනහිරට : ආඬිගම සිට ගල්ගමුව දක්වා පාර (මා සං අ), දකුණට : ඩී. එම්. බේබි නෝනා ගේ ඉඩම, බස්නාහිරට: ජී. එම්. විජේසිංහගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි නමයයි තුනක් (A: 0. R : 0, P : 12.693) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 510 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව S 59/248 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 4490 මගින් හා ඒ යටතේ උකස් කොට ඇපකොට ඇත.)

4. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුමාරවන්නි පළාතේ, පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ආනමඩුව අංක 656A ග්‍රාම නිලධාරි වසම තුළ ආනමඩුව - පෙට්ටිකුලම ග්‍රාමයේ පිහිටි "පෙට්ටිකුලම කැලේ" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වී. ගුහනන්දන් විසින් සාදන ලද 2003 පෙබරවාරි මස 09 දාතම හා අංක 1218 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1, 2, 3 සහ 4 වශයෙන් ලකුණු කොට ඇති ඒකාබද්ධ ඉඩම් කොටස්වලට මායිම්, උතුරට : එච්. එම්. උක්කුබණ්ඩා ගේ ඉඩම, නැගෙනහිරට : කේ. එච්. එම්. දිසානායකගේ ඉඩම, දකුණට : ඩබ්ලිව්. එම්. හේරත් බණ්ඩා ගේ ඉඩම, බස්නාහිරට: ආඬිගම සිට නවගත්තේගම දක්වා පාර (මා සං අ) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (A: 0. R : 2, P : 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග වෙළුම/පත්ඉරුව J 08/82 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 4492 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-75/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි**

01. කෞෂල්‍යා ව්‍යාපාර සමූහය.
ගිණුම් අංක : 0143 1000 0028.

02. ජී. එම්. විජේසිංහ, ජී. එම්. ඩී. කේ. විජේසිංහ සහ ආර්. ඒ. එල්. රණසිංහ.
ගිණුම් අංක : 3143 6500 0095/0143 5000 2038.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි දහ අට ලක්ෂ එක් දහස් දෙසිය හතළිස් දෙකයි ශත හතළිස් හතරක (රු. 11,801,242.44) මුදල ද, 2020 සැප්තැම්බර් 07 වැනි දින සිට අංක 5298 සහ 5632 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතුව මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතළිස් ලක්ෂයක (රු. 4,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළියද හා තවත් රුපියල් පනස් තුන් ලක්ෂ පනස් දහසක (රු. 5,350,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා

අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021.08.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.09.30 වැනි දින පෙ. ව. 11.15 ට ආනමඩුව, ගල්ගමුව පාර, අංක 69, ආනමඩුව සම්පත් බැංකු ශාඛා පරිශ්‍රයන් හි දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කුමාරවන්නි පළාතේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ තෙන්නන්කුරියාව ග්‍රාම නිලධාරි වසම තුළ තෙන්නන්කුරියාව (පළු) ග්‍රාමයේ පිහිටි "තෙන්නන්කුරියාව මූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. තන්ගවඩිවේලු යන අය විසින් සාදන ලද 2002 මාර්තු මස 13 දතම හා අංක 2112 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : සමිත මංචනායක සහ දිනේෂ් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : දිනේෂ් විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර, දකුණට : පාර සහ විමල් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : විමල් පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් පහළවක් (A: 2. R : 3, P : 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2112 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව LDO 153/198 යටතේ පුත්තලම දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-75/3

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

යූ. ජී. එල්. ජයතිලක.
ගිණුම් අංක : 0110 5000 3339.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.01.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අට කෝටි හතළිස් ලක්ෂ අනූ එක් දහස් දෙසිය අනූ හයයි ශත හැට හතක (රු. 84,091,296.67) මුදලද, 2017 දෙසැම්බර් මස 06 දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි විසි දෙලක්ෂ අසූදහසක (රු. 12,280,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three decimal Five per centum (3.5%) per annum (floor rate of 13.5%) බැගින් වූ පොළියද, රුපියල් අනූ නම ලක්ෂ පනස් දහසක (රු. 9,950,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three decimal Five per centum (3.5%) per annum (floor rate of 13.5%) බැගින් වූ පොළියද රුපියල් විසි නම ලක්ෂ තිස් දහසක (රු. 2,930,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Two per centum (2%) per annum (floor rate of 8%) බැගින් වූ පොළියද, රුපියල් කෝටි දෙකක (රු. 20,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළසක් (12%) බැගින් වූ පොළියද, රුපියල් එක් කෝටි විසි හය ලක්ෂ පනස් දහසක (රු. 12,650,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three per centum (3%) per annum (floor rate of 13%) බැගින් වූ පොළියද, රුපියල් එක් කෝටි හය ලක්ෂ විසිපන් දහසක (රු. 10,625,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three per centum (3%) per annum (floor rate of 13%) බැගින් වූ පොළියද රුපියල් විසි එක් ලක්ෂයක (රු. 2,100,000) මුදලක් සඳහා වාර්ෂිකව පස් වාර්ෂික භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය + වාර්ෂිකව සියයට දෙකක් (2%) (7.5% ක අවමයකට යටත්ව) බැගින් වූ පොළියද, හා තවත් රුපියල් තුන් කෝටි තිස්දෙලක්ෂ හය දහසක (රු. 3,326,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළියද දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.04.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2018.07.13 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි පිඹුරු අංක 2012/PO/17 හි ලොට් 1 හාල් මෝල යන්ත්‍ර සූත්‍ර සහ වී තොග ද සමග හිඟුරක්ගොඩ ඩී එස් සේනානායක වීදිය අංක 88 සම්පත් බැංකුව පීඑල්සී හිඟුරක්ගොඩ පරිශ්‍රයන් හිදී 2021.10.01 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පළමු උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය චෛත්‍ය පාර, අංක 664/1, ලක්ෂ්මන් හාල්මෝල හි ඇති සහ එහි

තබනු ලබන හෝ වෙනත් ඕනෑම ස්ථානයකට හෝ ස්ථානවලට ඉවත්කොට ගෙනගොස් තබනු ලබන, ගබඩා කරනු ලබන හෝ ස්ථාපිත කරනු ලබන මෙහි පහතින් මැනවින් විස්තර කොට ඇති එක් එක් සහ සියලු චංචල යන්ත්‍රාගාර, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ.

| | Machine | Make | Model | Serial No. |
|---|---|---|---|---|
| 01 | Color Sorter (Type 01) | Photon | 6SXM - 25S | |
| 02 | Elevators | | | |
| 03 | Rice Stock Tank | | | |
| 04 | Dryer (Type 01) | | | |
| 05 | Paddy Cleaner | Dingxin | TQLZ 125S | |
| 06 | Dryer (Type 02) | | | |
| 07 | Boiling Tank with Stainless Steel Sifter | | | |
| 08 | Weight Machine (06) | | | |
| 09 | De-stoner (Type 01, 02 & 03) (03) | | | |
| 10 | Rice Huller/One Shot (Type 01, 02 & 03) | MLGT25A | | 176/380/ 381 |
| 11 | Rice Polishers (Type 01 & 02) | | N 120 | |
| 12 | Rice Polisher - Glass Polisher | | CM 16 | 1105002 |
| 13 | Dust Fan (Type 01, 02 & 03) | | | |
| 14 | Rice Grader and Duster | | | |
| 15 | Grader (Type 01) | Dingxin | MMJP -100x3 | |
| 16 | Color Sorter (Type 02) | Torch | | |
| 17 | De - Stoner (Type 04) | | TQSXL 120x2 | |
| 18 | Grader (Type 02) (02) | | MJP 80x3 | 01206154 |
| 19 | Boiler | Robey | | B65578 |
| 20 | Screw Air Compressor | | L15-8 | CQL 108213 |
| 21 | Rice Stock Tank (04) | | | |
| 22 | Ash Stock Tank (02) | | | |

එමෙන්ම ඉහත සඳහන් පරිශ්‍රයන්ට ගෙනෙනු ලබන සහ ඒවායේ ස්ථාපිත කරනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර සහ එකී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ වෙනුවට හෝ ඒවායේ මොනයම් හෝ කොටසක් හෝ කොටස් කීපයකින් යුතු අංගයක් හෝ අංශයක් හෝ වෙනුවට කලින් කලට යොදනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර.

### දෙවන උපලේඛනය

මැදිරිගිරිය, චෛත්‍ය පාර, අංක 664/1, ලක්ෂ්මන් හාල්මෝල හි රු. 20,000,000 ක වී තොගය.

### තෙවන උපලේඛනය

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ, සිංහළ පත්තුවේ, මැදිරිගිරිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ගජබාපුර අංක 86 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කවුඩුලුවැව - අදියර 1 ග්‍රාමයේ පිහිටි "කවුඩුලු වැව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2012 පෙබරවාරි මස 04 දාතම හා අංක 2012/Po/17 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : FCP Po 76 හි ලොට් 15 (පාර සහ පාර සඳහා වෙන්කිරීම), නැගෙනහිරට : ආර්. එම්. කුසුමලතා යන අය විසින් හිමිකම් කියනු ලබන FCP Po 76 හි ලොට් 16 හි කොටසක්, දකුණට : සිසිර කුමාර යන අය විසින් හිමිකම් කියනු ලබන FCP Po 76 හි ලොට් 16 හි කොටසක් සහ අඩි පාර සහ බස්නාහිරට : FCP Po 76 හි ලොට් 15 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) හෝ හෙක්ටයාර 0.3097 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2012/Po/17 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී කවුඩුලුවැව - අදියර 1 ග්‍රාමයේ පිහිටි "කවුඩුලු වැව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. ඩබ්ලිව්. එල්. ඩී. රණසිංහ යන අය විසින් සාදන ලද 2001 ඔක්තෝබර් මස 26 දාතම හා අංක 1091 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : FCP Po 76 හි ලොට් 15 (පාර), නැගෙනහිරට : ආර්. එම්. කුසුමලතා යන අය විසින් හිමිකම් කියනු ලබන FCP Po 76 හි ලොට් 16 හි කොටසක්, දකුණට : සිසිර කුමාර (වඩා නිවැරදිව) යන අය විසින් හිමිකම් කියනු ලබන FCP Po 76 හි ලොට් 16 හි කොටසක් සහ අඩි පාර සහ බස්නාහිරට : FCP Po 76 හි ලොට් 15 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දෙකක් (අ. 0, රූ. 3, පර්. 2) හෝ හෙක්ටයාර 0.3097 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1091 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව F/4/131 යටතේ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 2330, 119 සහ 825 යටතේ සහ ඒ මගින් උකස්කොට ඇපකොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-73/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ඩී. ඩී. එම්. එච්. දෙව්පුර.
ගිණුම් අංකය : 0167 5000 1045

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.11.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි අනූ තුන් ලක්ෂ දහ තුන් දහස් දහ හතක (රු. 19,313,017 ) මුදලද, 2017 ඔක්තෝබර් මස 12 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැත්තෑ නම ලක්ෂ පනස් දහසක (රු. 17,950,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2018.07.20 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2018.07.13 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2021.10.08 වැනි දින පෙ. ව. 10.00 ට කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110, සම්පත් බැංකුව, පීඑල්සී පරිශ්‍රයන් හි දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, එගොඩ පත්තුවේ, දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්මනේවැව අංක 255 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දම්මනේවැව ග්‍රාමයේ පිහිටි "දම්මනේවැවයාය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. චන්ද්‍රරත්න යන අය විසින් සාදන ලද 2014 දෙසැම්බර් මස 08 දාතම හා අංක 2933 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FCP Po. 409 හි ලොට් 325 සහ 245 (පාර), නැගෙනහිරට : FCP Po. 409 හි ලොට් 245 (පාර) සහ 321, දකුණට : FCP Po. 409 හි ලොට් 321 සහ 323 සහ බස්නාහිරට: FCP Po. 409 හි ලොට් 323 සහ 325 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හයයි දශම හතක් (A: 0, R: 1, P: 36.7) හෝ හෙක්ටයාර 0.194 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග විශාල ඉඩම් කොටස සමග එකී අංක 2933 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි,

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දම්මනේවැව අංක 255 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දම්මනේවැව ග්‍රාමයේ පිහිටි "දම්මනේවැවයාය" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද FCP Po. 409 හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 320 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 325 සහ 245 (පාර), නැගෙනහිරට : ලොට් 245 (පාර) සහ 321, දකුණට : ලොට් 321 සහ 323 සහ බස්නාහිරට : ලොට් 323 සහ 325 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම එකයි නමයයි හතරක් (හෙක්ටයාර 0.194ක්) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සෑම සියලු දේ සමග විශාල ඉඩම් කොටස සමග එකී අංක FCP Po. 409 හි අනුව වෙළුම/පත්ඉරුව LDO/J/18/115 යටතේ පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 381 සහ 851 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ නුවරවැව දමනේවැව සංදීප හාල් මෝල, අංක 322 යන පරිශ්‍රයන්හි තබනු ලබන හෝ වෙනත් ඕනෑම ස්ථානයකට හෝ ස්ථානවලට ගෙනයනු ලබන සහ ඒවායේ තබනු ලබන ගබඩා කොට තබනු ලබන හෝ ස්ථාපිත කොට තබනු ලබන මෙහි මෑනවින් විස්තර කොට ඇති සියලුම හා එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ.

| *යන්ත්‍රයේ නම* | *ඒකක ගණන* | *වටිනාකම අනුව වෙළඳපල වටිනාකම (රු.)* |
|---|---|---|
| Color Sorter | 01 | 4,500,000.00 |
| Drier | 01 | 2,500,000.00 |
| Rubber Roll Husker | 01 | 425,000.00 |
| Polisher | 02 | 120,000.00 |
| Rice Grader | 01 | 450,000.00 |
| Stoner | 01 | 250,000.00 |
| Stock Tank - I | 01 | 225,000.00 |
| Stock Tank - II | 01 | 175,000.00 |
| ID Fan | 01 | 100,000.00 |
| 09 Double Elevator | - | 54,000.00 |
| Generator | 01 | 1,400,000.00 |
| **Total Value** | | **10,199,000.00** |

එකී පරිශ්‍රයන් වෙතට ගෙනෙනු ලබන හා ස්ථාපිත කරනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර සහ එකී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හෝ ඒවායින් කොටසක් හෝ ඕනෑම උපකරණ කොටසක් හෝ වෙනුවට කලින් කලට ගනු ලැබිය හැකි චංචල යන්ත්‍රසූත්‍ර.

උකස් බැඳුම්කර අංක SB/167/2017/MAC/001 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-73/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

සෙන්ට්‍රල් හෝම්ස් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0098 1000 3461

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.10.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි හැත්තෑ තුන් ලක්ෂ හත් දහස් තුන්සිය හතලිස් හයයි ශත තුනක (රු. 57,307,346.03) මුදලද, 2018 සැප්තැම්බර් මස 13 වැනි දින සිට අංක 3106, 1843 සහ 3566 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂික සියයට දහහතක් (17%) හා තවත් රුපියල් හාර කෝටි අසූ ලක්ෂ විසි දහසක (රු. 48,020,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද , දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.01.18 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.01.10 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 1 වන උපලේඛනයන්හි දේපල 2021.10.08 වැනි දින පෙ. ව. 11.00 ට සම්පත් බැංකුව මීගමුව සුපිරි ශාඛාවේ දී (නො. 408 ප්‍රධාන වීදිය, මීගමුව), 2 වන උපලේඛයන්හි දේපළ 2021.10.08 වැනි දින ප. ව. 12.30 ට සම්පත් බැංකුව ජාඇල ශාඛාවේ දී (අංක 165, රියැලිටි ප්ලාසා, මීගමුව පාර, ජාඇල) ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ පෙරියමුල්ල අංක 158B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පෙරියමුල්ල 2 වන කොට්ඨාසයේ හි පිහිටි හලාවත පාර, වරිපනම් අංක 107 දරන "ගොරකාගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ප්‍රසාද් විමලසේන යන අය විසින් සාදන ලද 2016 මාර්තු මස 24 දාතම හා අංක 9939 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : නුවන් ප්‍රසංන, ටයිටස් අප්පුහාමි සහ මාග්‍රට් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයිති ඉඩම, ගිණිකොණට : හලාවත පාර, නිරිතට : හලාවත පාර, වරිපනම් අංක 105 දරන එම්. කේ. සිවම්, හලාවත පාර, වරිපනම් අංක 97/2 දරන එම්. එස්. මොහොමඩ්, හලාවත පාර, වරිපනම් අංක 97/1 දරන ජී. ජී. ගුණසේන සහ හලාවත පාර, වරිපනම් අංක 97/3 සහ 97/4 ටී. ජේ. රජාබ් සහ ටී. ඒ. රජාබ් යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ වයඹට : වාස් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටයි හතරක් (A:0, R:1, P:18.84) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 9939 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

එකී පෙරියමුල්ල 2 වන කොට්ඨාසයේ හි පිහිටි "ගොරකාගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. කෲස් ද පෙරේරා යන අය විසින් සාදන ලද 1962 ජූලි මස 21 දාතම හා අංක 415/1962 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ඊ. ඩබ්ලිව්. ඩී. චාල්ස් අප්පුහාමි යන අයගේ ඉඩම, ගිණිකොනට : හලාවත පාර, නිරිතට : එස්. එල්. ඒ. වහීඩ් යන අයගේ ඉඩම සහ වයඹට : ඩබ්ලිව්. එස්. හර්බට් වාස් සහ බී. පී. පෙරේරා යන අයගේ ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහනමයයි දශම නමයක් (A:0, R:1, P:19.9) විශාල ඉඩම් කොටස සමග වෙළුම/පත්‍රිරුව G 88/110 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උකස් බැඳුම්කර අංක 3106 සහ 1843 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ වැලිගම්පිටිය උතුර, අංක 190/A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ජා-ඇල පිහිටි "කනුවන එස්ටේට්" වර්තමානයේ "ජා-ඇල ඔයිල් මිල්ස් යනුවෙන් හඳුන්වනු ලබන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානත තැන එස්. ජී. රණසිංහ යන අය විසින් සාදන ලද 2004 ජූලි මස 20 දාතම හා අංක 1986 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදා වෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 430 දරන පිඹුරේ ලොට් 01, නැගෙනහිරට : මෙහි ලොට් 3, දකුණට : මෙහි ලොට් 12 (මීටර් 11.5ක පළල පාර) සහ බස්නාහිරට : මෙහි ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0, R:0, P:7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1986 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව J 70/71 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1986 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 12, 13 සහ 14 යනුවෙන් ලකුණුකොට ඇති මාර්ග වෙන් කිරීම් සහ කානු සහ වෙනත් කානු දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

උකස් බැඳුම්කර අංක 3566 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-72

---

**මහජන බැංකුව - කන්තලේ ශාඛාව**

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපල් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙන්ඩ්‍රාසන්පුර ග්‍රාම නිලධාරි වසමේ කන්තලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොට්ඨාස අංක ආර්/30/2 92 කණුව හන්දිය කන්තලේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. සෙල්ලප්පිලෙයි මහතා විසින් 2003.09.29 වැනි දින මැන සකස් කරන ලද අංක 3504 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම කැබැල්ල.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 0 (රූඩ් එකයි) එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලුම දේ සමග

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩමේ වර්තමාන මැනුමක් වේ.

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ පත්තුවේ, කන්තලේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙන්ඩ්‍රාසන්පුර ග්‍රාම නිලධාරි වසමේ කන්තලේ ගමේ පිහිටි කන්තලේ නමැති ඉඩම - ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ් 01, පර්. 0 (රූඩ් එකයි) එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදි සියලු ම දේ සමග.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2021 සැප්තැම්බර් මස 22 වැනි බදාදා දින පෙ. ව. 11.00 ට මහජන බැංකුව කන්තලේ ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*වෙන්දේසිය පිළිබඳ දැන්වීම.*- කරුණාකර 2019.04.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2019.03.18 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපලට වෙත පිවිසීම.* - මහජන බැංකුව කන්තලේ ශාඛාවේ සිට කන්තලේ ප්‍රධාන පාරේ කිලෝ මීටර් 1.3 පමණ ගමන් කර කන්තලේ ඔරලෝසු කණුව මංසන්දිය දක්වා පැමිණ දකුණට ඇති ත්‍රිකුණාමල මාර්ගයට හැරී කිලෝ මීටර් 3.7 පමණ ගමන් කළ විට අංක 100, යුනිට් 14, 91 කන්තලේ යන ස්ථානයේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර) සහ කොමිස් මුදල මත අදාළ බදු,
4. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තුව රු. 1,500.00,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90%(සියයට අනුව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, කන්තලේ ශාඛාවේ කළමණාකරු වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර කළමණාකරු, මහජන බැංකුව, කන්තලේ ශාඛාවෙන් ලබාගත හැක. දුරකථන අංක 026 - 2234548/026-2234231.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 129 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

09-43

---

**මහජන බැංකුව - කොටහේන ශාඛාව**

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වූ වටිනා ව්‍යාපාරික ගොඩනැගිලි සහිත දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කොන්දගම්මුල්ල අංක 93 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොන්දගම්මුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ''බුලුගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 29 වැනි දින අංක 7608/1 දරන පිඹුරේ ''ලොට් අංක 1'' ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ලිෆ්ට් සිල්වා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : විමලසිරි ප්‍රනාන්දු යන අයගේ ඉඩමද, දකුණට : ලොට් අංක 04 ද, (මීටර් 6.00 ක මාර්ග රක්ෂිතයද,) බටහිර : ලොට් අංක 2 ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකක් (අ. 01 රූ. 0, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.40469 ක් වූ ද, මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H197/42 යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී 'ලොට් අංක 1'' දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කොන්දගම්මුල්ල අංක 93 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොන්දගම්මුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද, ''බුලුගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 29 දින අංක 7608/1 දරන පිඹුරේ ''ලොට් අංක 2'' ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : බ්‍රිජට් ප්‍රනාන්දු සහ ලිෆ්ට් සිල්වා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් අංක 1 සහ ලොට් අංක 4 (මීටර් 6.00 ක මාර්ග රක්ෂිතය ) සහ ලොට් අංක 3 ද, දකුණට : ලොට් අංක 03 සහ සූරිය වෙන්දේසි ඉඩමේ ලොට් A1 ඉඩමේ ඉතිරි කොටස ද, බටහිරට : ග්‍රියානා ප්‍රනාන්දු යන අයගේ ඉඩම ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකක් (අ. 1. රූ. 02, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.60703 ක් වූ ද මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H. 268/36 යටතේ ලියාපදිංචි වී ඇති ''ලොට් අංක 2'' දරන ඉහත කී බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කොන්දගම්මුල්ල අංක 93 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොන්දගම්මුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ''බුලුගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 29 දින අංක 7608/1 දරන පිඹුරේ ''ලොට් අංක 3'' ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට ලොට් අංක 2 සහ 4 ද (මීටර් 6.00 ක මාර්ග රක්ෂිතය), නැගෙනහිරට : ලොට් අංක 4 (මීටර් 6.00 ක මාර්ග රක්ෂිතය) විමලසිරි ප්‍රනාන්දු යන අයගේ ඉඩම සහ ඊ. එස්. සපරමාදු යන අයගේ ලොට් B දරන ඉඩම ද, දකුණට : ඊ. එස්. සපරමාදු යන අයගේ ලොට් B දරන ඉඩම සහ සූරිය වෙන්දේසි ඉඩමේ ලොට් A1 ඉඩමේ ඉතිරි කොටස ද, බටහිරට : ලොට් අංක 2 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් දහනවයයි දශම එකයි බිංදුවක් (අ. 01, රූ. 0, පර්. 19.10) හෙවත් හෙක්ටයාර් 0.045299 ක් වූ ද මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H. 328/12 යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 3 දරන

බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

පහත සඳහන් ඉඩම හරහා සහ ඒ ඔස්සේ වූ යාම ඒමේ මාර්ග පරවශතා අයිතිය ද ඊට ඇතුළත් වේ, එනම්

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කොන්දගම්මුල්ල අංක 93 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොන්දගම්මුල්ල ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, ''බුලුගහවත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2014 ඔක්තෝබර් මස 29 දින අංක 7608/1 දරන පිඹුරේ ''ලොට් අංක 4'' ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට ඃ ලෙට් අංක 1 ද, නැගෙනහිරට ඃ තුෂාරි ප්‍රනාන්දු යන අයගේ ඉඩම සහ ලොට් අංක 5 ද, (මීටර් 6.00 ක මාර්ග රක්ෂිතය), දකුණට ඃ ලොට් අංක 3 ද, බටහිරට ඃ ලොට් අංක 3 සහ ලොට් අංක 2 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූද ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම දෙකයි බිංදුවක් (අ.0, රූ.0, පර්. 22. 20) හෙවත් හෙක්ටයාර් 0.05614 ක් වූ ද මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ H197/43 යටතේ ලියාපදිංචි වී ඇති ලොට් අංක 4 දරන ඉහත කී බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2021 ඔක්තෝබර් මස 02 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මීගමුව නගරයට ආසන්න තෙල්වත්ත හන්දියෙන් දකුණට ඇති කිඹුලාපිටිය මාර්ගයේ කි. මී. 5ක් පමණ ගමන් කරන විට හමුවන කිඹුලාපිටිය හන්දියෙන් වම්පසට කටියල මාර්ගය හමුවේ. එම මාර්ගයේ මීටර් 750ක් පමණ ගමන් කර දකුණට ඇති කොන්දගම්මුල්ල මාර්ගයට පිවිස තවත් මීටර් 750ක් පමණ ගමන් කරන විට (කිස්ට් කර්මාන්ත ශාලාවේ ප්‍රධාන පිවිසුමේ සිට මීටර් 600ක් පමණ) වම් පසට හමුවන අතුරු මාර්ගයේ දේපළ පිහිටා ඇත. (මෙම දේපලෙහි රාන්කුරුල්ලා ගිණිකෙළි කර්මාන්ත ශාලාව පිහිටා ඇත)

වැඩි විස්තර සඳහා 2021.08.13 රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2021.08.13 දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවීම කළ යුතු ය.

01. ගැණුම් මිලෙන් 10%ක්,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
04. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 2,000,
05. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකු ප්‍රාදේශීය කළමනාකාර කොළඹ උතුර කාර්යාලයට ගෙවිය යුතු ය. එසේ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

දුරකථන අංක 94 (0) 112344982 - 5, 2327847 - 8
94 (0) 112430148 (RM) 94 (0) 112344985 (Loan)

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

''කිංස්වීව් රෙසිඩන්ස්''
282/3, 5 වන මහල,
කෝට්ටේ පාර, නුගේගොඩ.
දුරකථන අංක 071- 8021206.

09-82

---

## මහජන බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඇ වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නව බසාර් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නව බසාර් කොට්ඨාසයේ අංක 12, ලෙයාඩ්ස් පාර හෙවත් වර්තමානයේ ජේතවන මාවත යනුවෙන් හඳුන්වනු ලබන ස්ථානයේ පිහිටි වරිපනම් අංක 102 දරන සහ බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද 1980.04.13 වැනි දින අංක 2540 දරන පිඹුරේ ''ලොට් ඒ '' දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම පහයි හතරක් (අ. 0, රූ. 0, පර්. 3.54) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළු මාර්ග අයිතිය ද වේ. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඩී 140/104 යටතේ ලියාපදිංචි වී ඇත.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2021 සැප්තැම්බර් මස 30 වැනි දින පෙ. ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* .- 2021.08.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2021.08.13 වැනි දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - ග්‍රෑන්ඩ්පාස් මංසන්ධියේ සිට ජේතවන මාවත ඔස්සේ මීටර් 200ක් පමණ ගමන් කරන විට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ආරම්භයේ දකුණු පස ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ හි පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කොළඹ උතුර) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 011- 2344985, 2323865, 2433876
ෆැක්ස් අංකය : 011 - 2447299

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන අංක : 011 - 2053286/072- 3207533
076- 9217329.

09-77

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

කටාන, මුරුතන, මුරුතන පාරේ වරිපනම් අංක 10/17 දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 10 විශාලැති අගනා බිම් කැබැල්ලක්

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දූණගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාවේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 66 දරන ග්‍රාම නිලධාරි වසමේ මුරුතන පිහිටි මුරුතන පාරේ වරිපනම් අංක 10/17 දරන පරිශ්‍රයේ පිහිටි ''Bridgeland Estate'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එම්. එච්. ධම්මික බංඩාර විසින් 2017 මැයි මස 31 වැනි දින මැන සකස් කරන ලද අංක 3924 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් පිළිවෙලින් සහතික කරන ලද්දවූ ද DFCC Bank PLC (Successor to DFCC Vardhanan Bank PLC) නමට ලියන ලද්දවූ ද, 2017 අගෝස්තු මස 21 වැනි දින සහ 2019 ඔක්තෝබර් 24 දිනයන්හි සහතික කරන ලද අංක 12100 සහ 14034 දරන බැඳුම්කරයන් මත් අයවිය යුතු මුදල ගෙවීමට නේෂන්ස් වික්ටරි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් DFCC Bank PLC බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත පර්චස් 10 (අ. 0, රූ. 0, පර්චස් 10) 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පෙ. ව. 11.00 ට මීගමුව DFCC Bank PLC ශාඛා කාර්යාල පරිශ්‍රයේ ද මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid 19 වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති නිර්දේශයන්ට අනණුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2021.06.04 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2021.05.03 වැනි දින ''ද අයිලන්ඩ්'' ''දිවයින'' යන පුවත්පත් සහ ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්‍ය විය හැකි මාර්ගය.*- කොළඹ සිට පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ මංසන්ධිය දක්වා ගමන් කර එතැන් සිට ඉදිරියට තවත් මීටර් 750ක් පමණ මහ ඔය පාළම දක්වා ගමන් කර දකුණට හැරී පරණ පුත්තලම පාරේ මීටර් 70ක් පමණ ඉදිරියට ගමන් කර දකුණට පිහිටා ඇති අතුරු පාරේ මීටර් 100ක් පමණ ගමන් කිරීමෙන් අදළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද සහ ඒ මත අයවිය යුතු බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද සහතික සඳහා මුද්දර බදු ද වන අතර ගැණුම් මිලේ

ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වන අතර ශ්‍රී ලංකාණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011 - 2371371.

පෙර දැන්වීමකින් තොරව වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777 672082 ෆැක්ස් අංකය :2871184.

09-86

---

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

හොරණ ගොඩිගමුව රණවිරු මාවතේ පිහිටි අගනා කර්මාන්ත ශාලා සංකීර්ණයක් වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ කුඹුක පත්තුවේ හොරණ ප්‍රාදේශීය සභා සීමාවේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 606C දරන හල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ ගොඩිගමුව රණවිරු මාවතේ පිහිටි ''ඇටපන්විලදෙනිය' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එම්. කමල් පෙරේරා විසින් 2005 ජූලි මස 17 වැනි දින සකස් කරන ලද අංක 97/2005 දරන පිඹුරේ කැබලි අංක 1 දරන නැවත බෙද වෙන් කරන ලද 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සකස් කරන ලද අංක 219/2015 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 දරන ඉඩම් කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. පී. එන්. වාසනා විසින් සහතික කරන ලද්දවූ ද DFCC Bank PLC (Successor to DFCC Vardhana Bank PLC) නමට ලියන ලද්දවූ ද, 2019 ජනවාරි මස 31 සහ පෙබරවාරි මස 06 දිනයන්හි සහතික කරන ලද්දවූ ද අංක 955 සහ 959 දරන බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට වෙල්සි හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් DFCC Bank PLC බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත අක්කර 02යි, පර්චස් 31.60 (අ. 02, රූ. 0, පර්. 31.60) 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ. ව. 11.00 ට හොරණ DFCC Bank PLC ශාඛා කාර්යාල පරිශ්‍රයේ ද මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid 19 වසංගතය සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෞඛ්‍ය නිර්දේශයන්ට අණුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2020.09.25 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2020.09.14 වැනි දින ''දිනපතා 'දිවයින'' ''ද අයිලන්ඩ්'' සහ ''තිනකුරල්'' යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.-* කොළඹ සිට දක්ෂිණ අධි වේගී මාර්ගය ඔස්සේ කහතුඩුව පිටවීමේ දොරටුවෙන් පිට වී වම හැරී හොරණ පාරේ මීටර් 200 පමණ ගමන් කර දකුණට හැරී දියකඩ පාරේ කි. මී. 2.5 පමණ ගමන් කර වමට හැරී බංඩාරගම දක්වා දිවෙන මාර්ගයේ කි. මී. 1.1 පමණ ගමන් කර වමට හැරී රණවිරු මාවතේ මීටර් 600ක් පමණ ගමන් කිරීමෙන් අදල දේපළ කුඹුරට මෙපිටින් වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද සහ ඒ මත බදු ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වන අතර ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වන අතර ශ්‍රී ලංකාණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද ගෙවිය යුතු ය.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011 - 2371371.

පෙර දැන්වීමකින් තොරව වෙන්දේසිය අත්හිටුවීමට/අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 28736565, 0777 672082 ෆැක්ස් අංකය :28771184.

09-87

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2021.09.03 | සිකුරාදා | 2021.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.10 | සිකුරාදා | 2021.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.17 | සිකුරාදා | 2021.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.24 | සිකුරාදා | 2021.09.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2021.10.01 | සිකුරාදා | 2021.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.08 | සිකුරාදා | 2021.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.15 | සිකුරාදා | 2021.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.22 | සිකුරාදා | 2021.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.10.29 | සිකුරාදා | 2021.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2021.11.05 | සිකුරාදා | 2021.10.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.12 | සිකුරාදා | 2021.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.19 | සිකුරාදා | 2021.11.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.11.26 | සිකුරාදා | 2021.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.